සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2018 ජූලි

## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

(Economics for Business and Accounting)

2018-07-28
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) ***ප්‍රස්තාර කොළ*** *සපයනු ලැබේ.*

(7) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(8) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** කිසියම් තීරණයක් පිළිබඳ තෝරාගැනීමකදී කැපකරනු ලබන ඊළඟ හොඳම විකල්පයෙහි වටිනාකම හඳුන්වනු ලබන්නේ:

(1) ආවස්ථික පිරිවැය ලෙසයි. (2) ගිණුම්කරණ පිරිවැය ලෙසයි.
(3) වැළැක්විය හැකි පිරිවැය ලෙසයි. (4) ආන්තික පිරිවැය ලෙසයි.

**1.2** ඉල්ලුම් ප්‍රමාණයෙහි වෙනසේ ප්‍රතිශතය (%), මිලෙහි වෙනසේ ප්‍රතිශතයට වඩා වැඩි නම්, ඉල්ලුම:

(1) අනම්‍ය වේ. (2) ඒකීය නම්‍ය වේ. (3) නම්‍ය වේ. (4) පූර්ණ අනම්‍ය වේ.

**1.3** තනි විකුණුම්කරුවෙකු පමණක් සිටින වෙළෙඳපොළ ව්‍යුහය හඳුන්වනු ලබන්නේ:

(1) ඒකාධිකාරී තරඟය ලෙසයි. (2) පූර්ණ තරඟය ලෙසයි.
(3) ඒකාධිකාරය ලෙසයි. (4) කතිපයාධිකාරය ලෙසයි.

**1.4** යෙදවුමේ සමානුපාතික වැඩිවීම නිමැවුමේ සමානුපාතික වැඩිවීමට සමාන වූ විට එය හඳුන්වන්නේ:

(1) ස්ථාවර පරිමාණුකූල ඵල ලෙසයි. (2) වැඩෙන පරිමාණුකූල ඵල ලෙසයි.

(3) හීනවන පරිමාණුකූල ඵල ලෙසයි. (4) ආන්තික පරිමාණුකූල ඵල ලෙසයි.

**1.5** නිදහස් වෙළෙඳපොළ (free market) ක්‍රමයක රජය විසින් උපරිම මිලක් (price ceiling) පනවා ආරක්ෂා කරනු ලබන්නේ:

(1) පාරිභෝගිකයන්ය. (2) නිෂ්පාදකයන්ය.

(3) ආනයනකරුවන්ය. (4) තරඟකරුවන්ය.

**1.6** පටු මුදල් සැපයුම, මහජනයා විසින් වාණිජ බැංකුවල පවත්වාගෙන යනු ලබන, කාලීන සහ ඉතුරුම් තැන්පතු සහ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවල එකතුව හඳුන්වනු ලබන්නේ:

(1) පුළුල් මුදල් ගුණකය (Broad money multiplier) ලෙසයි.

(2) මුදල් පදනම (Monetary base) ලෙසයි.

(3) පුළුල් මුදල් සැපයුම [Broad money Supply ($M_2$)] ලෙසයි.

(4) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම [Consolidated Broad Money Supply ($M_2b$)] ලෙසයි.

**1.7** 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව, (2013 පාදක වර්ෂය = 100 ලෙස ගෙන) 2015 සහ 2016 වර්ෂ සඳහා, කොළඹ පාරිභෝගික මිල දර්ශකය පිළිවෙළින් 109.8 සහ 114.7 විය. වර්ෂ දෙක අතර උද්ධමන අනුපාතිකය වන්නේ:

(1) 4.3% කි. (2) 4.9% කි. (3) 4.5% කි. (4) 9.8% කි.

**1.8** දේශීය වෙළෙඳපොළේ මුදල් ඒකකයකින් මිලදී ගත හැකි භාණ්ඩ සහ සේවා ප්‍රමාණය හඳුන්වනු ලබන්නේ:

(1) මුදලේ දේශීය මූර්ත අගය (Internal real value of money) ලෙසයි.

(2) මුදලේ විදේශීය නිල අගය (Official external value of money) ලෙසයි.

(3) මුදලේ විදේශීය අගය (External value of money) ලෙසයි.

(4) මුදලේ විදේශීය මූර්ත අගය (Real external value of money) ලෙසයි.

**1.9** පහත සඳහන් ඒවා අතුරෙන්, ජාතික ආදායම් ප්‍රවාහයට කරනු ලබන විදීමක් (an injection) තෝරන්න:

(1) ඉතිරිකිරීම්. (2) බදුකරණය. (3) ආනයන. (4) අපනයන.

**1.10** 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව, 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන අනුපාතිකය වූයේ:

(1) 3.1% කි. (2) 5% කි. (3) 7.5% කි. (4) 4.5% කි.

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය* ***සත්‍ය*** *හෝ* ***අසත්‍යදැයි*** *දක්වන්න.* ***සත්‍ය*** *හෝ* ***අසත්‍ය*** *යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 ආර්ථික විද්‍යාව යනු සමාජ විද්‍යාවකි.

1.12 භාණ්ඩයක එක් අතිරේක ඒකකයක් පරිභෝජනය කිරීමෙන් පුද්ගලයෙකු ලබන තෘප්තිය මුළු උපයෝගිතාවය ලෙස හඳුන්වනු ලැබේ.

1.13 කෙටි කාලයේදී ආයතනයක නිෂ්පාදන සාධක, ස්ථාවර සාධක සහ විචල්‍ය සාධක වශයෙන් බෙදා වෙන්කළ හැකිය.

1.14 ගනුදෙනු චේතනාව මත මුදලට ඇති ඉල්ලුම සහ මූර්ත ආදායම අතර සෘණාත්මක සම්බන්ධතාවයක් ඇත.

1.15 මිල සහ ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පැවතීමට බලපාන ප්‍රධාන හේතු දෙක වන්නේ ආදායම් ප්‍රතිවිපාකය සහ ආදේශන ප්‍රතිවිපාකයයි.

*අංක 1.16 සිට 1.20 දක්වා ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුළ දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමග, උත්තර පොතේ ලියන්න.*

1.16 ලාභය යනු …………………… *(ව්‍යවසායකත්වය / ප්‍රාග්ධනය)* සඳහා ලැබෙන ප්‍රතිලාභයයි.

1.17 වෙළෙඳපොළ සමතුලිතයේදී අතිරික්ත ඉල්ලුමක් හෝ අතිරික්ත සැපයුමක් …………………… *(ඇත / නැත)* .

1.18 …………………… *(සාමාන්‍ය / බාල)* භාණ්ඩවලට ධන ආදායම් ඉල්ලුම් නම්‍යතාවයක් පවතී.

1.19 මුදල් ඉල්ලුම් සහ මුදල් සැපයුම් වක්‍ර එකිනෙක ඡේදනය වන (intersection) ලක්ෂ්‍යයේදී තීරණය වන පොලී අනුපාතිකය …………………… *(සමතුලිත පොලී අනුපාතිකය /අතිරික්ත පොලී අනුපාතිකය)* ලෙස හඳුන්වනු ලැබේ.

1.20 භාණ්ඩ සහ සේවා නිෂ්පාදනයේ වැඩිවීමත් සමඟ මුළු සමාජ පද්ධතියේම සිදුවන සමස්ත දියුණුව හඳුන්වනු ලබන්නේ …………………… *(ආර්ථික වර්ධනය / ආර්ථික සංවර්ධනය)* ලෙසයි.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

(a) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ [Production Possibility Curve (PPC)] උපකල්පන තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) ධනවාදී (වෙළෙඳපොළ) ආර්ථික ක්‍රමය සහ සමාජවාදී (සැලසුම්ගත) ආර්ථික ක්‍රමය අතර වෙනස්කම් තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(c) එක්තරා භාණ්ඩයක් සඳහා පහත සඳහන් ඉල්ලුම් ($Qd$) සහ සැපයුම් ($Qs$) සමීකරණ ඔබට දී ඇත:

$$Qd = 80 - 6p$$

$$Qs = -20 + 4p$$

(i) භාණ්ඩයේ සමතුලිත මිල **ගණනය කරන්න**. (ලකුණු 02)

(ii) භාණ්ඩයේ සමතුලිත ප්‍රමාණය **ගණනය කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

(a) මුළු නිෂ්පාදනය [Total Production (TP)], සාමාන්‍ය නිෂ්පාදනය [Average Production (AP)] සහ ආන්තික නිෂ්පාදනය [Marginal Production (MP)] අතර ඇති සම්බන්ධතාවය **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) ඒකාධිකාරය (Monopoly) සහ ඒකාධිකාරී තරඟය (Monopolistic Competition) අතර වෙනස්කම් හතරක් (04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

(a) රජය මගින් භාණ්ඩයක් සඳහා ඒකක සහනාධාරයක් ප්‍රදානය කිරීමේ ප්‍රතිවිපාක (consequences) ප්‍රස්තාරයක් ආධාරයෙන් **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) (i) රජය, වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයට මැදිහත්වීමට හේතු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(ii) සහනාධාර ප්‍රදානය කිරීම හැර, වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයට රජය මගින් මැදිහත් වියහැකි වෙනත් ක්‍රම දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(a) **A** සහ **B** යන රටවල් දෙකම තිරිඟු සහ අල නිෂ්පාදනය කරන බව සිතන්න. සම්පත් ඒකක එකක් භාවිත කරමින් රටවල් දෙකම නිෂ්පාදනය කරනු ලබන තිරිඟු සහ අල ඒකක ප්‍රමාණයන් පහත වගුවේ සාරාංශගත කර දක්වා ඇත:

| නිෂ්පාදිතය / රට | තිරිඟු (කිලෝග්‍රෑම්) | අල (කිලෝග්‍රෑම්) |
|---|---|---|
| **A** | 6 | 4 |
| **B** | 1 | 3 |

එක් එක් නිෂ්පාදිතය නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් සාපේක්ෂ වාසිය (comparative advantage) ඇත්තේ කුමන රටකටදැයි ආධාරක ගණනය කිරීම් ද සහිතව, **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) ඇමරිකා එක්සත් ජනපද ඩොලරයට (US Dollor) එරෙහිව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය (devaluation) වීමේ ප්‍රතිවිපාක හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 20)

**06 වන ප්‍රශ්නය**

(A) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තිවල ගුණාත්මක පාලනයන් (qualitative controls) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(ii) "ද්‍රවශීලතාව සහ ලාභදායිතාව යන එකිනෙකට ගැටෙන අරමුණු දෙක අතර සමබරතාවය පවත්වා ගැනීමේ අභියෝගයට බැංකුවලට මුහුණදීමට සිදුවේ".

ඉහත ප්‍රකාශනය **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(B) එක් අවුරුද්දක කාලපරිච්ඡේදයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් කල්පිත දත්ත ඔබට දී ඇත:

| | **රු. මිලියන** |
|---|---:|
| පෞද්ගලික පරිභෝජන වියදම් | 1,500 |
| රජයේ පරිභෝජන වියදම් | 1,500 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 3,000 |
| ශුද්ධ අපනයන | 2,500 |
| විදේශවලින් ලද ශුද්ධ සාධක ආදායම (ශුද්ධ විදේශීය ප්‍රාථමික ආදායම) | 750 |
| ප්‍රාග්ධන ක්ෂයවීම් | 1,000 |

ඉහත තොරතුරු භාවිත කරමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) දළ දේශීය වියදම (Gross Domestic Expenditure). (ලකුණු 04)

(b) වෙළෙඳපොල මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 02)

(c) වෙළෙඳපොල මිලට දළ ජාතික නිෂ්පාදිතය [Gross National Product (GNP)]. (ලකුණු 02)

(d) වෙළෙඳපොල මිලට ශුද්ධ ජාතික නිෂ්පාදිතය [Net National Product (NNP)]. (ලකුණු 02)

(C) රජයක සාර්ව ආර්ථික අරමුණු (Macro Economic Objectives) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |